# මූලික සටහන්පොත් හා පාලන ගිණුම් අභ්‍යාස ;

## 01.

සීමිත සුමුදු පොදු සමාගම වෙළඳ ව්‍යාපාරයක් වන අතර එය එකතු කළ අගය මත බදු ( VAT ) සඳහා ලියාපදිංචි වී ඇත. සමාගම භාණ්ඩ මිලදී ගැනීම ණය පදනම මත පමණක් සිදු කරන අතර , භාණ්ඩ විකිණීම මුදලට සහ ණයට යන දෙයාකාරයෙන් ම සිදු කරනු ලබයි. 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත තොරතුරු ව්‍යාපාරයේ ණයගැති සහ ණයහිමි ලෙජරයෙන් උපුටා ගන්නා ලදී.

2020.03.31 දිනට ණයගැති ලෙජරය ( රු. 000 )

| විස්තරය | නාමල් ට්‍රේඩර්ස් | ගමගේ ට්‍රේඩර්ස් | නදුන් ට්‍රේඩර්ස් | එකතුව |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 100 | 50 | 150 | 300 |
| විකුණුම් ( 8% ක VAT සහිතව ) | - | 324 | 486 | 810 |
| මුදල් ලැබීම් | (75) | (50) | (500) | (625) |
| දුන් වට්ටම් | (5) | - | (10) | (15) |
| **අවසන් ශේෂය** | **20** | **324** | **126** | **470** |

2020.03.31 දිනට ණයහිමි ලෙජරය ( රු. 000 )

| විස්තරය | සමන් ට්‍රේඩර්ස් | අමල් ට්‍රේඩර්ස් | මහේෂ් ට්‍රේඩර්ස් | එකතුව |
|---|---|---|---|---|
| ආරම්භක ශේෂය | 300 | - | 150 | 450 |
| ගැනුම් ( 8% ක VAT සහිතව ) | 540 | 432 | 216 | 1 188 |
| මුදල් ගෙවීම් | (290) | (200) | (150) | (640) |
| දුන් වට්ටම් | (10) | - | - | (10) |
| **අවසන් ශේෂය** | **540** | **232** | **216** | **988** |

2020.03.01 දිනට ණයගැති සහ ණයහිමි ලෙජර් ශේෂ ලැයිස්තුවල එකතුව අදාළ පාලන ගිණුම් වල එදිනට වූ ශේෂය සමඟ සමාන විය.

2020.03.01 දින මුදල් ගිණුමේ ශේෂය රු. 50 000 ක් විය. ණයගැති හා ණයහිමි ලෙජර තුල ඇතුලත් මුදල් ගනුදෙනුවලට අමතරව පහත මුදල් ගනුදෙනු ද 2020 මාර්තු මාසය තුල දී සිදු විය.

- සමාගමේ මුදලට විකුණුම් රු. 972 000 ක් විය. ( 8 % VAT සහිතව )
- සේවක අර්ථසාධක අරමුදල ( EPF ) සඳහා සේවක දායකත්වය ලෙස රු. 48 000 ක් අඩු කර ගැනීමෙන් පසුව රු. 552 000 ක වැටුප් ගෙවන ලදී.
- 2020 පෙබරවාරි මාසය සඳහා EPF රු. 120 000 ක් සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල ( ETF ) සඳහා රු. 18 000 ක් ප්‍රේෂණය කරන ලදී .
- රු. 250 000 ක් වෙනත් වියදම් සඳහා ගෙවන ලදී.

EPF සඳහා සේවක සහ සේව්‍ය දායකත්වය පිළිවෙලින් 8% ක් සහ 12% ක් වේ. තවද ETF සඳහා සේව්‍ය දායකත්වය 3% කි. EPF සහ ETF යන දෙකෙහිම දායකත්වයන් සේවකයින්ගේ දළ වැටුප මත ගණනය කරනු ලැබයි. සමාගම කිසියම් මාසයක EPF සහ ETF ඊළඟ මාසයෙහි 5 වන දින යේ දී ප්‍රේෂණය කරනු ලැබයි.

2020.03.01 දිනට VAT පාලන ගිණුමේ බැර ශෞෂය රු. 40 000 කි.

( වෙනත් වියදම් සඳහා VAT නොමැති බව උපකල්පනය කරන්න. ගනුදෙනුවල දිනයන් නොසලකා හරින්න. )

අවශ්‍ය වන්නේ ,

( 1 ) 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත් :

( i ) ගැනුම් ජර්නලය

( ii ) මුදල් ලැබීම් ජර්නලය

( iii ) මුදල් ගෙවීම් ජර්නලය

( 2 ) 2020.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්

( I ) මුදල් ගිණුම

( ii ) වෙළඳ ණයගැති පාලන ගිණුම

( iii ) එකතු කළ අගය මත බදු ( VAT ) පාලන ගිණුම

( I v ) වැටුප් පාලන ගිණුම

( V ) ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල් ( EPF ) ගිණුම ( 2020 – A/L )

## 02.

2020.03.31 න් අවසන් වර්ෂය සඳහා ණයගැතියන්ගේ තොරතුරු සාරාංශගතව පහත දැක්වේ.

| විස්තරය | සසිත් | රෂාන් | යේෂක | සඳුන් | එකතුව |
|---|---|---|---|---|---|
| 2019.04.01 ශේෂය .......................... | 200 | 150 | 300 | 75 | 725 |
| විකුණුම් .......................................... | 800 | 700 | 450 | 220 | 2 170 |
| ආපසු එවුම් ...................................... | - | 50 | - | 25 | 75 |
| දුන් වට්ටම් ...................................... | 80 | 20 | - | - | 100 |
| මුදල් ලැබීම් ...................................... | 400 | 880 | 200 | 270 | 1 750 |
| හාණිකරණ අලාභ .......................... | - | 30 | 50 | - | 80 |

ඉහත තොරතුරු පොදු ලෙජරයේ හා ණයගැති ලෙජරයේ වාර්තා කිරීමේ දී පහත වැරදි සිදු වී ඇත.

1) විකුණුම් ජර්නලය එකතු කිරීමේ දී රු. 70 000 ක් වැඩියෙන් එකතු කර ඇත.
2) රෂාන් ආපසු එවූ භාණ්ඩ පොදු ලෙජරයේ රු. 5 000 ක් අඩුවෙන් සටහන් වී ඇති අතර ණයගැති ලෙජරයේ සටහන් වී නැත.
3) සසිත් ට දුන් වට්ටම් ඔහුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් වී ඇත.
4) හාණිකරණ අලාභ සටහන් වීම ව්‍යාපාරයේ පොත්වලින් මඟ හැරී ඇත.
5) පාලන ගිණුමේ බැර පැත්ත රු. 10 000 ක් අඩුවෙන් එකතු කර ඇත.

අවශ්‍ය වන්නේ ,

01. නිවරදි ණයගැති පාලන ගිණුම
02. දෝෂ සහිත ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව

03. වැරදි ණයගැති පාලන ගිණුමේ ශේෂය හා දෝෂ සහිත ණයගැති ලෙජරයේ ශේෂ ලැයිස්තුව සැසඳීමේ ප්‍රකාශය

## 03.

සිළුමිණගේ ව්‍යාපාරයේ 2020.03.31 දිනට වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමේ ශේෂය රු. 35 000 ක් හා මුදල් ගිණුමේ ශේෂය රු. 600 000 ක් විය. එදිනට මුදල් ගිණුමේ ශේෂය බැංකු ප්‍රකාශනයේ ශේෂය සමඟත් වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමේ ශේෂය වෙළඳ ලැබිය යුතු දැ ශේෂ ලැයිස්තුවේ එකතුව සමඟත් අසමාන විය. පසුව කළ පරීක්ෂාවේ දී පහත කරුණු හෙළිදරව් විය.

1) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 40 000 කි.
2) තැන්පත් කළ නමුත් උපලබ්දි නොවූ චෙක්පත් රු. 23 000 කි.
3) නිකුත් කළ නමුත් මුදල් ගෙවීම් ජර්නලයේ සටහන් නොවූ චෙක්පතක වටිනාකම රු. 15 000 කි.
4) මුදල් ලැබීම් ජර්නලයේ වෙළඳලැබිය යුතු දැ විශ්ලේෂණ තීරුවේ එකතුව රු. 8 000 කින් අඩු වී ඇත.
5) ණයගැතියකු සෘජුවම බැංකු ගිණුමට ප්‍රේෂණය කරන ලද රු. 19 000 ක් හා බැංකු ගාස්තු රු. 2 000 ක් පිළිබඳව ව්‍යාපාරයේ ගිණුම්වල සටහන් වී නොමැත.
6) වෙළඳ ලැබිය යුතු දැ වලින් ලද රු. 24 000 ක චෙක්පතක් වෙළඳ ලැබිය යුතු දැ උප ලෙජරයේ සටහන් වී ඇත්තේ රු. 27 000 ක් ලෙසය.
7) වෙළඳ ලැබිය යුතු දැ ශේෂ ලැයිස්තුවේ රු. 14 000 ක බැර ශේෂයක් හර ශේෂයක් ලෙස සටහන් වී ඇත.

අවශ්‍ය වන්නේ ,

01. වෙළඳ ලැබිය යුතු දැ සහ මුදල් පාලන ගිණුමේ ශේෂයන් නිවරදි කිරීම
02. 2020 මාර්තු මාසය සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශනය.
03. නිවරදි කළ වෙළඳ ලැබිය යුතු දැ ශේෂයෙන් ආරම්භ කරමින් වෙළඳ ලැබිය යුතු දැ සැසඳුම් ලේඛනය.
04. ඉහත අංක 3,4 සහ 5 නිවරදි කිරීම සඳහා ජර්නල් සටහන් ( සංලක්ෂ්‍ය අවශ්‍ය නැත )

## 04.

මදාරා වෙළෙන්දෝ එකතුකල අගය මත බදු ( VAT ) සඳහා ලියාපදිංචි වී ඇති ආයතනයකි. පහත ශේෂ 2018.12.31 දිනට ආයතනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| වෙළඳ ණයගැතියෝ ............................................................ | 120 000 |
| මුදල් ........................................................................................ | 30 000 |
| වෙළඳ ණයහිමියෝ .............................................................. | 70 000 |
| ගෙවිය යුතු VAT ................................................................ | 30 000 |

පහත ගනුදෙනු 2019.01.31 දිනෙන් අවසන් මාසයේ දී මෙම ආයතනයේ සිදු වී ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2019.01.05 | සීමිත අමල් ( පුද්ගලික ) සමාගමෙන් රු. 230 000 ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. ( මෙම මිලදී ගැනීම තුල VAT රු. 30 000 ඇතුළත් වේ. ) |
| 2019.01.10 | රු. 150 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 207 000 කට අත්පිට මුදලට විකුණන ලදී. ( මෙම විකුණුම් තුල VAT රු. 27 000 ක් ඇත්ලත් වේ. ) |
| 2019.01.12 | 2018.12.31 දිනට ණයගැති ශේෂය සම්පූර්ණයෙන් පියවන පරිදි වට්ටමකට යටත්ව රු. 110 000 ක් ලැබුණි. |

| | |
|---|---|
| 2019.01.15 | 2018.12.31 දිනට වෙළඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල පියවන ලදී. |
| 2019.01.16 | සීමිත අමල් ( පුද්ගලික ) සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලද අතර රු. 5 000 ක වට්ටමක් ලැබුණි. |
| 2019.01.18 | රු. 360 000 ක ලකුණු කල මිලක් සහිත භාණ්ඩ රු. 345 000 කට නාදන් වෙළඳුන්ගෙන් ණයට මිලදී ගන්නා ලදී. ( මෙම මිලදී ගැනීම තුල VAT රු. 45 000 ක් ඇතුලත් වේ ) |
| 2019.01.20 | රු. 350 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 460 000 නට සීමිත ජයමාල් පොදු සමාගමට ණයට විකුණන ලදී. ( මෙම විකුණුම් තුල VAT රු. 60 000 ක් ඇතුලත් වේ. ) |
| 2019.01.28 | රු. 60 000 ක කාර්යාල වියදම් ගෙවන ලදී. |
| 2019.01.30 | සීමිත ජයමාල් පොදු සමාගමෙන් ලැබිය යුතු මුදලෙන් කොටසක් පියවීම සඳහා රු. 360 000 ක් ලැබුණි. |

වියදම් සඳහා VAT නොමැති බව උපකල්පනය කරන්න.

අවශ්‍ය වන්නේ ,

( 1 ) 2019.03.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත් :

( i ) මුදල් ලැබීම් ජර්නලය

( ii ) මුදල් ගෙවීම් ජර්නලය

( iii ) ගැනුම් ජර්නලය

( 2 ) 2019.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්

( I ) වෙළඳ ණයගැති පාලන ගිණුම

( ii ) වෙළඳ ණයහිමි පාලන ගිණුම

( iii ) VAT පාලන ගිණුම

( I v ) මුදල් ගිණුම

## 05.

පහත ශේෂ 2019.12.31 දිනට මදාරා පොදු සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් උපුටා ගන්නා ලදී.

| | රු. |
|---|---|
| වෙළඳ ණයගැතියෝ ........................................................... | 120 000 |
| මුදල් ........................................................................................ | 30 000 |
| වෙළඳ ණයහිමියෝ ......................................................... | 70 000 |
| තොගය .................................................................... | 30 000 |

පහත ගනුදෙනු 2020.01.31 දිනෙන් අවසන් මාසයේ දී මෙම ආයතනයේ සිදු වී ඇත.

| දිනය | ගනුදෙනුව |
|---|---|
| 2020.01.05 | සීමිත අමල් ( පුද්ගලික ) සමාගමෙන් රු. 200 000 ක භාණ්ඩ ණයට මිලදී ගන්නා ලදී. |
| 2020.01.10 | රු. 150 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 180 000 කට අත්පිට මුදලට විකුණන ලදී. |
| 2020.01.12 | 2019.12.31 දිනට ණයගැති ශේෂය සම්පූර්ණයෙන් පියවන පරිදි වට්ටමකට යටත්ව රු. 110 000 ක් ලැබුණි. |

| | |
|---|---|
| 2020.01.15 | 2019.12.31 දිනට වෙළඳ ණයහිමියන්ට ගෙවිය යුතු මුදල පියවන ලදී. |
| 2020.01.16 | සීමිත අමල් ( පුද්ගලික ) සමාගමට ගෙවිය යුතු මුදල පියවන ලද අතර රු. 5 000 ක වට්ටමක් ලැබුණි. |
| 2020.01.18 | රු. 320 000 ක ලකුණු කල මිලක් සහිත භාණ්ඩ රු. 300 000 කට නාදන් වෙළඳුන්ගෙන් ණයට මිලදී ගන්නා ලදී. |
| 2020.01.20 | රු. 340 000 ක් පිරිවැය වූ භාණ්ඩ රු. 400 000 නට සීමිත ජයමාල් පොදු සමාගමට ණයට විකුණන ලදී. |
| 2020.01.28 | රු. 60 000 ක කාර්යාල වියදමු ගෙවන ලදී. |
| 2020.01.30 | සීමිත ජයමාල් පොදු සමාගමෙන් ලැබිය යුතු මුදලෙන් කොටසක් පියවීම සඳහා රු. 360 000 ක් ලැබුණි. |

අවශ්‍ය වන්නේ ,

( 1 ) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත මූලික සටහන් පොත් :

( i ) මුදල් ලැබීම් ජර්නලය

( ii ) මුදල් ගෙවීම් ජර්නලය

( iii ) ගැනුම් ජර්නලය

( 2 ) 2020.01.31 දිනෙන් අවසන් මාසය සඳහා පහත ගිණුම්

( I ) වෙළඳ ණයගැති පාලන ගිණුම

( ii ) වෙළඳ ණයහිමි පාලන ගිණුම

( iii ) ගැනුම් ගිණුම

( iv ) විකුණුම් ගිණුම

( v ) මුදල් ගිණුම

( 3) 2020.01.31 දිනට තොගයේ පිරිවැය

06.

**2020.03.31** දිනට ප්‍රියංකර සමාගමේ ණයගැති පාලන ගිණුමේ ශේෂය රු. 100 000 ක් විය. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී පහත කරුණු හෙළිදරව් කරගෙන ඇත.

1) විකුණුම් ජර්නලයේ එකතුව රු. 4 000 කින් අඩු වී ඇත.

2) ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 2 000 කින් වැඩි වී ඇත.

3) පැතුම් සමාගම සිදු කළ රු. 7 000 ක භාණ්ඩ ආපසු එවුම් සම්පූර්ණයෙන් පොත්වලින් මඟහැරී ඇත.

4) ණයගැති ලෙජරයේ තිබූ කීර්ති සමාගමේ ගිණුමේ රු. 5000 ක හර ශේෂය , ණයහිමි ලෙජරයේ එම සමාගම නමින් ඇති ගිණුමට මාරු කර ඇතත් , පොදු ලෙජරයට එය පිටපත් කර නොමැත.

5) ණයගැති ලෙජරයේ සුසිල් සමාගම නමින් වූ රු. 3 000 ක ශේෂය භාණිකරණ අලාභ ලෙස කපාහැර ඇතත් එය පොදු ලෙජරයට පිටපත් කර නොමැත.

6) ණයගැති ලෙජරයේ ඇති සුනිමල්ගේ ගිණුමේ වූ රු. 2 500 ක ශේෂය ඉදිරියට ගෙන ඇත්තේ බැර ශේෂයක් ලෙසය.

7) සිසිර සමාගමට ණයට විකුණුම් රු. 23 500 ක් ණයගැති ලෙජරයේ වාර්තා කර තිබුණේ රු. 32 000 ක් ලෙසය .

8) 2020.03.31 දිනට ඇති ණයගැති ශේෂය මත සිදු කළ යුතු 10% ක අපේක්ෂිත හාණිකරණ අලාභ සඳහා ඉඩහැරීම මෙතෙක් සිදු කර නොමැත .

අවශ්‍ය වන්නේ,

1. ණයගැති පාලන ගිණුම
2. 2020.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු ණයගැති ශේෂය
3. ඉහත තොරතුරු අනාවරණය වීමට ප්‍රථම ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව.

## 07.

නූර්ලයින් සමාගමේ 2018/01/01 දිනට ණයගැති ශේෂ ලේඛණය පහත පරිදි විය.

| ණයගැතියා | ශේෂය (000) |
|---|---|
| සමිතා | 60 |
| ලසිතා | 40 |
| හසිතා | 20 |
| මනුතා | (5 ) |
| | 115 |

2018/12/31 දිනෙන් අවසන් මාසය තුලදී ණයගැතියන් සම්බන්ධව පහත ගනුදෙනු සිදුවන ලදී (000)

| ණයගැතියා | ණයටවිකුණුම් | ආපසු එවුම් | ලද චෙක්පත් | අගරු චෙක්පත් | දුන් වට්ටම් | බොල්ණය කපා හැරීම |
|---|---|---|---|---|---|---|
| සමිතා | 600 | 20 | 420 | - | - | - |
| ලසිතා | 720 | - | 670 | 25 | - | - |
| හසිතා | 430 | 10 | 390 | - | - | - |
| මනුතා | 610 | - | 490 | - | 30 | - |
| නයනා | 55 | - | - | - | - | 55 |
| | 2,415 | 30 | 1,970 | 25 | 30 | 55 |

2018 /01/01 දිනට ණයගැති ශේෂ ලේඛනයේ එකතුව ණයගැති පාලන ගිණුමේ ශේෂය හා සමාන වුවත් 2017/12/31 දිනට එම ශේෂ එකිනෙකට වෙනස් විය. අසමාන වීමට අදාල හේතු පහත සඳහන් පරිදි හඳුනා ගෙන ඇත.

01. 2017/12/31 න් අවසන් වර්ෂය තුලදී කපාහල කමලාගෙන් ලැබිය යුතුව තිබූ රු. 35,000 ක් මෙම මාසය තුලදී ලැබී ඇත. මෙය ණයගැති පාලන ගිණුමට බැර කර ඇත. නමුත් මෙය ණයගැති ලෙජරයේ සටහන් කර නොමැත.
02. ලසිතාගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද පසුව බැංකුව අගරු කරන ලද චෙක්පත් ණයගැති පාලන ගිණුමේ සටහන් කර නොමැත.
03. ණයගැති පාලන ගිණුම එකතු කිරීමේදී හර පැත්ත රු. 25,000 ක් වැඩියෙන් එකතු කර ඇත.
04. රු.45,000 ක අත්පිට විකුණුම් ණයගැති පාලන ගිණුම තුල ණයට විකුණුම් ලෙස වාර්තා කර ඇත.

2018/01/01 දිනට අඩමානණය සඳහා වෙන්කිරීම රු. 12,000 ක් වූ අතර 2018/12/31 දිනට හර ණයගැති ශේෂය මත 10% ක අඩමාන ණය වෙන්කිරීමක් කල යුතුය.

අවශ්‍ය වන්නේ ,

01 . 2018/12/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයගැති ලෙජරයේ ගිණුම්

02 . ඉහත වැරදි නිවරදි කිරීමට පෙර 2018/12/31 දිනට ණයගැති පාලන ගිණුමේ ශේෂය

03 . ඉහත වැරදි නිවරදි කළ පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය

04 . 2018/12/31 න් අවසන් වර්ෂය සඳහා අඩමාන ණයසඳහා වෙන්කිරීමේ ගිණුම

## 08.

පහත තොරතුරු 2018 අගෝස්තු මාසය සඳහා හෂාන් බේකරුකරුවන්ට අදාල වන අතර අදාල උපයෝගී පොත්වල ද වාර්තා කොට ඇත. ලෙජරයේ පහත සටහන් තවමත් තබා නොමැති බව හඳුනා ගෙන ඇත.

ණයට විකුණුම් සහ අනෙකුත් විස්තර .

| ගනුදෙනු කරු | අගෝස්තු 01 දිනට ශේෂය | ගනුදෙනු | | | |
|---|---|---|---|---|---|
| | | ණයට විකුණුම් | ආපසු එවුම් | අගෝස්තු මාසයේදී ගෙවූ මුදල් | වට්ටම් |
| ඇන්ටන් | 105,000 | 80,000 | 10,000 | 150,000 | 4,500 |
| බාලසිංහම් | 41,000 | 32,000 | 4,000 | 62,000 | 1,500 |
| ගෝපාල් | 206,000 | 306,000 | 6,500 | 310,000 | 8,500 |
| රමේෂ් | 145,000 | 210,000 | 10,500 | 158,890 | 6,100 |
| | | | | | |
| | | | | | |

අවශ්‍ය වන්නේ,

i. ඉහත ණයට විකුණුම් වල දක්වා ඇති එක් එක් ගනුදෙනුව සඳහා ප්‍රභව ලියවිලි දක්වන්න.
ii. පාලන ගිණුම් පවත්වාගෙන යන්නේ යැයි උපකල්පනය කර පොදු රෙලජරයේ අවශ්‍ය ගිණුම් දැක්වීමය.
iii. ණයගැති ලෙජරයේ අවශය ගිණුම් දක්වන්න.

## 09.

(අ ) පාලන ගිණුම් යනු කුමක්ද ? පාලන ගිණුම් පවත්වාරෙගන යාමේ වාසි විස්තර කරන්න.

( ආ ) සමන් බතික් පුද්ගලික සමාගම බතික් ඇඳුම් නිපදවා අලෙවි කරයි. දිවයින පුරා වෙළඳ ණයහිමියන් සහ ණයගැතියන් ( තොග සහ සිල්ලර ) 400 ක් හා 500 ක් පමණ ආයතනය සතුවේ. 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සමාගමේ පොත්වලින් අපුටා ගන්නා ලදී.

| විස්තර | රු. |
|---|---|
| ආරම්භක ශේසය ( 2017.04.01 ) | |
| ණයහිමියන්ගේ ලෙජරය ( හර ශේෂය ) | 255,000 |
| ණයහිමියන්ගේ ලෙජරය ( බැර ශේෂය ) | 3,982,000 |
| ණයගැතයන්ගේ ලෙජරය ( හර ශේෂය ) | 4,586,000 |
| ණයගැතියන්ගේ ලෙජරය ( බැර ශේෂය ) | 72,000 |

වර්ෂය තුල සිදුවූ ගනුදෙනු ,

ගැනුම් 16,854,000

ආපසු යැවුම් 768,000

විකුණුම් 28,247,000

ආපසු එවුම් 351,000

ණයගැතියන්ගෙන් ලද මුදල් 22,861,000

දුන් වට්ටම් 846,000

ණයහිමියන්ට ගෙවූ මුදල් 14,529,000

ලද වට්ටම් 498,000

ණයගැතියන්ට ආපසු යැවූ මුදල් 52,000

ලද ලැබිය යුතු බිල්පත් 1,266,000

අහරු වූ ලැබිය යුතු බිල්පත් 75,000

නිකුත් කල ගෙවිය යුතු බිල් 675,000

ණයගැතියන් විසින් බැංකුවට එවූ සෘජු ප්‍රේෂණ 621,000

ලියා හල බොල්ණය 49,000

කලින් ලියා හල ආපසු ලද බොල්ණය 25,000

වෙළඳ ණයහිමියන්ගේ පාලන ගිණුමට මාරු කිරීම් 30,000

අවසාන ශේෂය 2018.03.31 දිනට ,

ණයහිමියන්ගේ ලෙජරජ ( හර ශේෂය ) 231,000

ණයගැතියන්ගේ ලෙජරය ( බැර ශේෂය ) 136,000

අවශ්‍ය වන්නේ,

2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමන් බතික් ( පුද්ගලික ) සමාගමේ පොදු ලෙජරයේ දක්වනු ලබන ණයහිමි ලෙජර් පාලන ගිණුම සහ ණයගැති ලෙජර් පාලන ගිණුම් පිළියෙල කරන්න.

## 10.

පහත තොරතුරු හැන්ඩ් ක්ලේ නිෂ්පාදන සමාගමේ 2019.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අදාල වේ.

ණයට ගැනුම් පිළිබඳ විස්තර,

| සැපයුම් කරුගේ නම | මාර්තු 31 දිනට ශේෂය | ගනුදෙනු | | | |
|---|---|---|---|---|---|
| | | ණයට ගැනුම් රු. | ගැනුම් ආපසු යැවුම් රු. | මාර්තු 31 වන විට ගෙවූ මුදල් රු. | වට්ටම් රු. |
| සීමා හට් | 125,000 | 100,000 | 10,000 | 150,000 | 4,500 |
| මරිනා හට් | 41,000 | 58,000 | 4,000 | 85,000 | 1,500 |

ණයට විකුණුම් පිළිබඳ විස්තර

| ගැනුම් කරුගේ නම | මාර්තු 31 දිනට ශේෂය | ගනුදෙනු | | | |
|---|---|---|---|---|---|
| | | ණයට විකුණුම් රු. | විකුණුම් ආපසු එවුම් රු. | මාර්තු 31 වන විට ලද මුදල් රු. | වට්ටම් රු. |
| ලයන් හෝටලය | 65,000 | 75,000 | 5,000 | 120,000 | 5,000 |
| සමන් ආර්ට් | 135,000 | 168,000 | 3,000 | 215,000 | 4,800 |

අවශ්‍ය වන්නේ ,

- i. එකිනෙක ණයට විකුණුම් හා ණයට ගැනුම් ගනුදෙනු වලට අදාල මූලාශ්‍ර ලියවිලි සඳහන් කරන්න.
- ii. පාලන ගිණුම් පවත්වාගෙන යාමට අදාල පොදු ලෙජරයේ අවශ්‍ය ගිණුම්
- iii. ණයගැති හා ණයහිමි ලෙජරයන් සකස් කරන්න.

## 11.

ගෘහ අලංකරණ ව්‍යාපාරයක නිරත ශ්‍යාමල් ගේ ව්‍යාපාරයේ පොත්වලින් පහත සඳහන් තොරතුරු 2018 මාර්තු මාසය සඳහා ණයට විකුණුම් හා ණයට ගැනුම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- i. 2018 මාර්තු 02 දින එකක් රු. 160,000 ක් බැගින් අලංකාර සැරසිලි පහක් ඇක්සස් ලිමිටඩ් වෙත අලෙවිකරන ලදී
- ii. 2018 මාර්තු 03 වන දින ණයගැතියකුගෙන් ලැබී බැංකුවේ 2018.02.27 දින තැන්පත් කළ රු. 45,000 චෙක්පතක් බැංකුව අගරු කරන ලදී
- iii. හානි වූ එකු සැරසිල්ලක් ඇක්සස් ලිමිටඩ් විසින් 2018 මාර්තු 05 වන දින ආපසු එවන ලදී.
- iv. එකක් රු. 50,000 ක් වූ සැරසිලි 10 ක් ජයරත්න සමාගමට 2018 මාර්තු 6 වන දින අලෙවි කරන ලදී.
- v. 2018 මාර්තු 10 වන දින රු. 600,000 ක් විකුණුම් මිලකට දඹුල්ල සමාගම වෙත අලෙවි කරන ලදී . එහිදී 5% වෙළඳ වට්ටමක් ලබා දෙන ලදී.
- vi. 2018 මාර්තු 16 දින අගරු කළ චෙක්පත වෙනුවෙන් මුදල ලැබුණි.
- vii. පෙඉරවාරි මාසයේ විකුණුම් වෙනුවෙන් රු. 10,000 ක වට්ටමක් දුන් පසු රු. 200,000 මසුදලක් ණයගැතියන්ගෙන් ලැබුණි.
- viii. 2018 මාර්ත් 22 දින දඹුල්ල සමාගමෙන් අදාල නියමිත මුදල ලැබුණි.
- ix. ලංකා බැංකුවට අලංකාර සැරසිලි 5 ක් 2018 මාර්තු 25 දිනවිකුණන ලද අතර සැරසිලි වල ප්‍රදර්ශණය කර තබූ මිල රු. 85,000 ක් වූ අතර මෙම අලංකාර සැරසිල්ල අලෙවි කරන විටදී 10% ක වෙළඳ වට්ටමක් ලබා දෙන ලදී.
- x. ඇක්සස් ලිමිටඩ් වෙතින් 2018 මාර්තු 28 දින මුදල් ලද අතර එහිදී 5% වට්ටමක් ලබා දෙන ලදී
- xi. 2018 මාර්තු 30 දින ජයරත්න සමාගමෙන් නියමිත මුදල ලැබුණි.
- xii. පෙබරවාරි මාසයේ කපා හල රු. 16,000 ක බොල් ණය 2018 මාර්තු 30 දින ලැබුණි.
- xiii. මාසයේ ලියා හල බොල්ණය රු. 11,000 කි.

අතිරේක තොරතුරු,

2018 මාර්තු 01 දිනට ආරම්භක ණයගැති ශේෂය රු. 375,000 කි.

අඩමාන ණය සඳහා වෙන්කිරීම ණයගැති අවසාන ශේෂය මත 10% කි.

අවශ්‍ය වන්නේ ,

1) ගනුදෙනු විකුණුම් ජර්නලයේ ,
2) මුදල් ලැබීම් ජර්නලය,
3) ණයගැති පාලන ගිණුම පෙන්වන්න.

## 12.

නුවන්තගේ ව්‍යාපාරයේ වෙළඳ ලැබිය යුතු දැ පිළිබඳ පහත සඳහන් තොරතුරු ඉදිරිපත් කරන ලදී.

| වෙළඳ ලැබිය යුතු දැ | විකුණුම් | ආපසු එවුම් | මුදල් | දුන් වට්ටම් | 2019.03.31 ශේෂය |
|---|---|---|---|---|---|
| සුසන්තිකා | 130,000 | - | 80,000 | 4,000 | 46,000 |
| දර්ශා | 70,000 | 5,000 | 20,000 | 2,000 | 43,000 |
| මනෝරි | 60,000 | - | 35,000 | - | 25,000 |
| සුනීතා | 50,000 | 8.000 | 10,000 | - | 32,000 |
| ටානියා | 80,000 | - | 20,000 | 1,000 | 59,000 |
| | | | | | |

වෙනත් තෙරෙතුරු,

- ❖ ආපසු එවුම් ගිණුම රු. 3,000 අඩුවෙන් වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමට බැර වී ඇත.
- ❖ විකුණුම් ජර්නලයේ එකතුව වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමට පිටපත් කිරීමේදී රු. 13,000 අඩුවෙන් සටහන් කොට ඇත.
- ❖ ටානියාගේ බොල්ණය රු. 5,000 වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමේ හා බොල්ණය ගිණුමේ සටහන් කොට ඇත.
- ❖ දුන් වට්ටම් වෙළඳ ලැබිය යුතු පාලන ගිණුමට රු. 2,000 ක් අඩුවෙන් හර කොට විකුණුම් ගිණුමට බැර කොට ඇත.
- ❖ වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුමේ සටහන් කොට ඇති මුදල් ලැබීම් ශේෂය රු . 165,000 කි.

අවශ්‍ය වන්නේ ,

01. පොදු ලෙජරයේ වැරදි නිවරදි කිරීමට අදාල ජර්නල් සටහන්
02. 2019.03.31 දිනට වැරදි නිවරදි කිරීමට පෙර වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුම.
03. 2019.03.31 දිනට සංශෝධිත වෙළඳ ලැබිය යුතු දැ පාලන ගිණුම
04. වෙළඳ ලැබිය යුතු ශේෂ සැසඳීමේ ලේඛනය.

## 13.

VAT සඳහා ලියාපදිංචි වී ඇති මංජුගේ ව්‍යාපාරයේ 2019.04.01 දිනට පහත සඳහන් ශේෂ උපුටා ගෙන ඇත.

| | |
|---|---|
| ඉඩම් | රු. 1,200,000 |
| ගොඩනැඟිලි | රු. 1,000,000 |
| මෝටර් රථ | රු. 750,000 |
| තොගය | රු. 200,000 |
| වෙළඳ ලැබිය යුතු දැ - අමර | රු. 150,000 |
| බැංකු ශේෂය | රු. 900,000 |
| ගෙවිය යුතු VAT | රු. 200,000 |
| වෙළඳ ගෙවිය යුතු දැ - මාලා | රු. 500,000 |
| ප්‍රාග්ධනය | ? |

2019 අප්‍රේල් මාසය තුල පහත සඳහන් ගනුදෙනු සිදුවිය,

01. ණයට ගැනුම් 02.

| දිනය | ණයහිමියා | VAT රහිත වටිනාකම |
|---|---|---|
| 4/5 | මාලා | 150,000 |
| 4/8 | ගීතා | 200,000 |
| 4/12 | නීතා | 75,000 |
| 4/22 | සීතා | 180,000 |

ණයට විකුණුම්

| දිනය | ණයගැතියා | VAT රහිත වටිනාකම |
|---|---|---|
| 4/7 | අමර | 560,000 |
| 4/08 | පියල් | 440,000 |
| 4/19 | සමන් | 360,000 |
| 4/23 | කමල් | 80,000 |

03. ආපසු යැවුම්

| දිනය | ණයහිමියා | VAT රහිත වටිනාකම ( රු) |
|---|---|---|
| 4/10 | ගීතා | 15,000 |
| 4/18 | සීතා | 20,000 |
| 4/25 | නීතා | 10,000 |

| දිනය | ණයගැතියා | VAT රහිත වටිනාකම( රු) |
|---|---|---|
| 4/10 | පියල් | 20,000 |
| 4/18 | සමන් | 18,000 |
| 4/25 | කමල් | 8,000 |

04. මුදල් ලැබීම් සහ ගෙවීම්

| දිනය | විස්තරය | වටිනාකම (රු. ) |
|---|---|---|
| 4/1 | ප්‍රාග්ධනය යෙදවීම් | 800,000 |
| 4/2 | අමරගෙන් මුදල් ලැබීම් | 90,000 |
| 4/5 | මාලාට ගෙවීම් | 300,000 |
| 4/8 | වැටුප් ගෙවීම් | 125,000 |
| 4/12 | කුලී ගෙවීම් | 15,000 |
| 4/13 | පියල්ගෙන් මුදල් ලැබීම් | 220,000 |
| 4/14 | ගීතාට ගෙවීම් | 150,000 |
| 4/16 | වරිපනම් ගෙවීම් | 10,000 |
| 4/17 | නීතාට ගෙවීම් | 45,000 |

| | | |
|---|---|---|
| 4/22 | සමන්ගෙන් ලැබීම් ......................................................................... | 200,000 |
| 4/23 | අත්පිට විකුණුම් ......................................................................... | 40,000 |
| 4/25 | සීතාට ගෙවීම් ......................................................................... | 80,000 |
| 4/27 | 10% වට්ටමකට යටත්ව නෘතාට ඉතිරි මුදල ගෙවන ලදී ..................... | ? |
| 4/28 | 5% වට්ටමකට යටත්ව කමල්ගෙන් සම්පූර්ණ මුදල ලැබුනා ............... | ? |
| 4/30 | මංජුගේ රක්ෂණ වාරිකයක් ව්‍යාපාරය ගෙව්වා .................................. | 12,000 |

මෙයට අමතරව පහත ගැපීම්ද සිදුකල යුතුවේ,

- ගොඩනැගිලි සහ මෝටර් රථ පිළිවෙලින් 5% හා 20% බැගින් වාර්ෂිකව ක්ෂය කළ යුතුය.
- 2019.04.30 දිනට උපචිත මෙහෙයුම් වියදම් රු. 8,000 කි.
- VAT අනුපාතය 15 % කි.

අවශ්‍ය වන්නේ,

01. 2019 අප්‍රේල් මාසය සඳහා ,
    - මුදල් ලැබීම් ජර්නලය හා මුදල් ගෙවීම් ජර්නලය
    - ගැනුම් ජර්නලය සහ විකුණුම් ජර්නලය
    - ණයගැති පාලන ගිණුම හා ණයහිමි පාලන ගිණුම
    - VAT පාලන ගිනුම
    - මුදල් පාලන ගිණුම

## 14.

නිසල සමාගමේ 2018.03.31 දිනෙන් අවසන් වසර සඳහා පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත.

2018.03.31 දිනට ණයගැති පාලන ගිණුම් ශේෂ රු.200000 ක් විය. මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී පහත සඳහන් කරුණු අනාවරණය කොටගෙන ඇත.

i. ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව රු.4000 ක් අඩුවෙන් සටහන් වී ඇත.

ii. විකුණුම් ජර්නලයේ එකතුව රු.8000 ක් අඩුවෙන් සටහන් වී ඇත.

iii. ණයගැති ලෙජරයේ ණයගැතියෙක් වූ සුසිරි සමාගමේ ගිණුමේ රු.10000 ක හර ශේෂය එම සමාගම නමින් ඇති ණයහිමි ලෙජරයේ ඇති ගිණුමට මාරු කර ඇතත් ඒ පිළිබඳව පොදු ලෙජරයේ සටහන් තබා නැත.

iv. ලසන්ත සමාගම සිදුකල රු.14000 ක ආපසු එවුම් පොත් වලින් සම්පූර්ණයෙන්ම මග හැරී ඇත.

v. ණයගැති ලෙජරයේ රු.5000 ක් වූ සුනිල්ගේ ගිණුමේ ශේෂය ඉදිරියට ගෙන ගොස් ඇත්තේ බැර ශේෂයක් ලෙසටය.

vi. නිමල් සමාගම නමින් ණයගැති ලෙජරයේ ඇති ශේයන් රු.6000 ක් බොල්ණය ලෙස කපා හැර ඇතත් ඒ පිළිබඳව පොදු ලෙජරයට පිටපත් කර නැත.

vii. අනිල් සමාගමට කල ණයට විකුණුම් 46000 ක් ණයගැති ලෙජරයේ වාර්තා කර තිබුණේ රු.64000 ක් ලෙසටය.

viii. 2018.03.31 දිනට ණයගැති ශේෂය මත සිදුකල යුතු බොල්ණය සඳහා වෙන්කිරීම සහ වට්ටම් සඳහා වෙන්කිරීම 2% මෙතෙක් සිදුකර නැත.

JMC Learning
"your virtual learning partner"
Nuwan Sampath

පහත සඳහන් දේ පෙන්වන්න.
1) සංශෝධිත ණයගැති පාලන ගිණුම
2) ඉහත තොරතුරු අනාවරණය වීමට පෙර ණයගැති ශේෂ ලැයිස්තුවේ එකතුව
3) 2018.03.31 දිනට ශේස පත්‍රයේ දැක්විය යුතු ණයගැති ශේෂය.

## 15.

දිල්කිගේ ව්‍යාපාරයේ 2017.9.30 සකසන ලද ණයගැති ලෙජර් ශේෂ ලැයිස්තුවේ එකතුව රු. 14,500 කි. එය එදින පාලන ගිණුමේ ශේෂය සමඟ එකඟ නොවූයෙන් වෙනසට හේතු ලෙස පහත දැක්වෙන කරුනු සොයා ගන්නා ලදී.

A. විකුණුම් ජර්නලයේ එකතුව රු.18,500 කි. ගැනුම් ජර්නලයේ එකතුව රු. 28,500 කි. මෙම එකතුන් ණයගැත් හා ණයහිමි පාලන ගිණුම් වලට ගෙන ගොස් ඇත්තේ මාරුකරය.
B. ණයහිමි පාලන ගිණුමේ බැර ශේෂයත් සමඟ හිලව් කල රු. 200 ක්වූ ණයගැති පාලන ගිණුමේ හර ශේෂය අදාල පාලන ගිණුම්වල ගිණුම් තබා නොමැත.
C. සම්පත් නැමැති ණයගැතියාගේ බැර ශේෂය වූ රු. 2,700 ශේෂ ලැයිස්තුවට ගෙන ගොස් ඇත්තේ හර ශේෂයක් ලෙසිනි.
D. ලසන්ත විසින් ආපසු එවුම් රු. 3,200 ණයගැති ලෙජරයට ගෙන ගොස් ඇත්තේ රු. 2,200 ක් ලෙසිනි.
E. ණයගැති ලෙජරයේ සුසිල්ගේ හර ශේෂය වූ රු.3,000 බොල්ණය ලෙස කපා හැර ඇතත් පොදු ලෙජරයේ ගිණුම් තබා නොමැත.
F. අත්පිට විකුණුම් වලින් ලද රු. 7,200 ක් ණයගැති පාලන ගිණුමේ ණයගැතියන්ගෙන් ලද මුදලක් ලෙස ඇතුලත් කර ඇත.
G. කමල් ගෙන් ලද රු.2,500 ක චෙක්පත අහරු වී ඇති අතර එය කමල්ගේ ගිණුමේ පමණක් සටහන් තබා ඇත.

අවශ්‍ය වන්නේ,

1) වැරදි නිවරදි කිරීමට පෙර ණයගැති පාලන ගිණුමේ ශේෂය
2) වැරදි නිවරදි කල පසු ණයගැති පාලන ගිණුමේ ශේෂය හෙවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ පෙන්වන ණයගැති පාලන ගිණුමේ ශේෂය

## 16.

2017 මාර්තු 31 දිනට සීමිත රත්නායක සමාගමේ ණයගැති පාලන ගිණුමේ රු.125,250 ක්විය . විකුණුම් ලෙජරයේ ශේෂ ලැයිස්තුවේ එදිනට ශේෂය රු 67,900 ක් බව රත්නායක සමාගමේ විගණක විසින් සොයාගෙන ඇත. ගිණුම් පොත් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් වැරදිද සොයාගන්නා ලදී.

01. බොල්ණයක් ලෙස ලියා හරින ලද රු. 4,500 ක ණයක් වෙනුවෙන් සටහන් පාලන ගිණුමේ තබා නොමැත
02. ආපසු එවුම් පොත රු. 25,000 ක් අඩුවෙන් එකතු කොට ඇත.
03. රු. 21,500 ක හර ශේෂයක් හා රු. 3,500 ක බැර ශේෂයක් ශේෂ ලැයිස්තුවෙන් මඟ හැරී ඇත.
04. ශේෂ ලැයිස්තුව රු. 2,500 ක් වැඩියෙන් එකතු කොට ඇත.

05. විකුණුම් ලෙජරයේ රු. 3,500 ක හර ශේෂයක් බැර ශේෂයක් ලෙස ලැයිස්තුවට ඇතුලත් කර ඇත.

06. ගැනුම් ලෙජරයේ සිරිපාලගේ ගිණුමේ රු. 10,250 ක් වූ බැර ශේෂයක් විකුණුම් ලෙජරයේ ඔහුගේ ගිණුමට මාරු කිරීම පිළිබඳව පාලන ගිණුමේ සටහන් තබා නෙමැත .

07. ආර් . හේරත් විසින් ආපසු එවන ලද රු. 3,400 ක් වූ භාණ්ඩ නිවරදිව පාලන ගිණුමේ ඇතුලත් කර ඇතත් ආර් . හේරත්ගේ ගිණුමේ ඒ පිළිබඳ සටහන් තබා නොමැත.

08. ණයගැතියෙකුගෙන් ලද රු 1,500 ක් වූ චෙක්පත් බැංකුවෙන් ආපසු එවා ඇත. බැංක් ගිණුමේ සහ ණයගැති ගිණුමේ සටහන් ඇතුලත් කර ඇතත් පාලන ගිණුමේ මේ පිළි බඳව සටහන් තබා නොමැත.

පහත සඳහන් දෑ පිළියෙල කරන්න,

a) ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් සංශෝධිත ණයගැති පාලන ගිණුම

b) ණයගැති පාලන ගිණුමේ සංශෝධිත ශේෂය හා විකුණුම් ලෙජරයෙන් උපුටාගත් මුල් ශේෂය සංශෝධනය කිරීමේ ප්‍රකාශය.